# ජාතික රාජ්‍ය සභාවේ
# 1973 අංක 21 දරන මුද්දර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූනි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1973 ජූලි මස 13 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 21 දරන මුද්දර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූනි මස 30 වන දින]

එල්. ඩී.—ඕ. 88/71.

මුද්දර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 21 දරන මුද්දර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. 1971 අංක 50 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මුද්දර ආඥාපනතේ 34 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— 247 වන අධිකාරයේ 34 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ඇතැම් අවස්ථාවල දී කුවිතාන්සි දීමට ඇති බැඳීම.

34. රුපියල් විස්සක් හෝ ඊට වැඩි ප්‍රමාණයක යම් මුදලක් ලබන්නා වූ හෝ රුපියල් විස්සක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සඳහා වූ යම් විනිමය බිල් පත්‍රයක්, චෙක් පතක් හෝ පොරොන්දු නෝට්ටුවක් ලබන්නා වූ හෝ ණයක් ගෙවීමෙහි ලා හෝ ණයක යම් කොටසක් ගෙවීමෙහි ලා වටිනාකමින් රුපියල් විස්සක හෝ ඊට වැඩි ප්‍රමාණයක යම් චංචල දේපළක් ලබන්නා වූ යම් තැනැත්තකු විසින් ඒ සඳහා යථා පරිදි මුද්දර ගසන ලද කුවිතාන්සියක් දිය යුතු ය :

එසේ වුව ද කොමසාරිස්වරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින්, ඒ නිවේදනයේ නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි කරුණු සම්බන්ධයෙන් යථා පරිදි මුද්දර ගසන ලද කුවිතාන්සියක් දීමේ අවශ්‍යතාව අත් හරිනු ලැබිය හැකි ය.".

3. 1958 අංක 16 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) මේ වගන්තිය යටතේ පිටසනක් කරනු ලැබ ඇති යම් නීත්‍යානුකූල ලේඛනයක් අවස්ථාවෝචිත පරිදි, යථා පරිදි මුද්දර ගසනු ලැබූවක් ලෙස නැතහොත් මුද්දර ගාස්තු අය කළ නො

හැක්කක් ලෙස සලකනු ලැබිය යුතු ය. ඉදින් එය මුද්දර ගාස්තු අය කළ හැක්කක් නම්, එය සාක්ෂි වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ පිළිගත යුතු අතර, මුලින් යථා පරිදි මුද්දර ගසනු ලැබ තිබුණාක් මෙන් ඒ අනුව ක්‍රියා කිරීම ද එය ලියාපදිංචි කිරීම ද කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද පහත සඳහන් නීත්‍යනුකූල ලේඛනයක් පිටයන් කිරීමට ඉහත සඳහන් වගන්තියෙහි කිසිවකින් කොමසාරිස්වරයාට බලය නොලැබිය යුතු ය:—

(අ) ශ්‍රී ලංකාවේ දී ලියා අත්සන් කරනු ලැබ හෝ ශ්‍රී ලංකාවේ දී ප්‍රථමයෙන් ලියා අත්සන් කරනු ලැබ, අවස්ථාවෝචිත පරිදි එසේ ලියා අත්සන් කිරීමේ හෝ ප්‍රථමයෙන් ලියා අත්සන් කිරීමේ දින යෙහි සිට එක් මසක් ගත වීමෙන් පසු තමා වෙත ගෙන එන ලද යම් නීත්‍යනුකූල ලේඛනයක් ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරනු ලැබ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රථමයෙන් ලියා අත්සන් කරනු ලැබ, ශ්‍රී ලංකාවට මුලින් ලැබී තුන් මසක් ගත වීමෙන් පසුව තමා වෙත ගෙන එන ලද යම් නීත්‍යනුකූල ලේඛනයක් ; හෝ

(ඇ) ලිවීමෙන් හෝ ලියා අත්සන් කිරීමෙන් පසු යථා පරිදි මුද්දර නොගසා ගෙන එන ලද සත පහළොවකට නොවැඩි ප්‍රමාණයක මුද්දර ගාස්තුවක් අය කළ හැකි යම් නීත්‍යනුකූල ලේඛනයක් හෝ එසේ ගෙන එන ලද විනිමය බිල් පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. 1958 අංක 16 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

" මුද්දර නොගසන ලද කුවිතාන්සි පිළිබඳ විශේෂ විධිවිධාන.

40. සත පහළොවක මුද්දර ගාස්තුවක් අය කළ හැකි යම් කුවිතාන්සියක් මුද්දර නොගසා යම් රාජ්‍ය ගිණුම් විගණනයක දී යම් නිලධරයකුට භාර දෙනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී එම නීත්‍යනුකූල ලේඛනය තහනම් පිට තබනු

වෙනුවට, යථා පරිදි මුද්දර ගසන ලද කුවිතාන්සියක් ඒ වෙනුවට ආදේශ කරන ලෙස එම නිලධරයා විසින් සිය අභිමතය අනුව නියම කරනු ලැබිය හැකි ය.".

5. 1958 අංක 16 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" යථා පරිදි මුද්දර නොගසන ලද නීත්‍යානුකූල ලේඛන සාක්ෂි වශයෙන් පිළිගත නොහැකි බව ආදිය.

41. මුද්දර ගාස්තුව අය කළ හැකි කිසිම නීත්‍යානුකූල ලේඛනයක් ඒ නීත්‍යානුකූල ලේඛන යට යථා පරිදි මුද්දර ගසා ඇතහොත් මිස සාක්ෂි පිළිගැනීමට නීතියෙන් හෝ පාර්ශ්වකරුවන්ගේ කැමැත්තෙන් බලය ලැබී ඇති කිසිම තැනැත්තකු විසින් කිසිම කාර්යයක් සඳහා සාක්ෂි වශයෙන් පිළි නොගත යුතු ය. තව ද එවැනි යම් තැනැත්තකු විසින් හෝ යම් රාජ්‍ය නිලධරයකු විසින් ඒ නීත්‍යානුකූල ලේඛනය අනුව ක්‍රියා කිරීම එය ලියාපදිංචි කිරීම හෝ එහි තථ්‍යභාවය සහතික කිරීම හෝ නොකළ යුතු ය:

එසේ වුව ද—

(අ) සත පහළොවකට නොවැඩි මුද්දර ගාස්තුවක් අය කළ හැකි නීත්‍යානුකූල ලේඛනයක් නොවන එවැනි යම් නීත්‍යානුකූල ලේඛනයක් නැතහොත් විනිමය බිල් පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් වෙනුවෙන් අය කළ හැකි මුද්දර ගාස්තුව හෝ ප්‍රමාණවත් ලෙස මුද්දර නොගසන ලද නීත්‍යානුකූල ලේඛනයක් සම්බන්ධයෙන් වූ විට මුද්දර ගාස්තුව සම්පූර්ණවීමට අවශ්‍ය මුදල පහත සඳහන් දණ්ඩනය ද සමග ගෙවීමට ඒ නීත්‍යානුකූල ලේඛනය හෝ විනිමය බිල් පත්‍රය හෝ පොරොන්දු නෝට්ටුව සියලු සාධාරණ

ව්‍යතිරේකයන්ට සහ 42 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සාක්ෂි වශයෙන් පිළිගත යුතු ය:—

රු. සත

(i) මුද්දර ගාස්තුව හෝ අඩු ප්‍රමාණය රු. 2 ට වැඩි නොවන විට 2 50;

(ii) මුද්දර ගාස්තුව හෝ අඩු ප්‍රමාණය රු. 2 ට වැඩි නමුදු රු. 7·50 ට වැඩි නොවන විට 5 0;

(iii) මුද්දර ගාස්තුව හෝ අඩු ප්‍රමාණය රු. 7.50 ට වැඩි නමුදු රු. 20 ට වැඩි නොවන විට 10 0;

(iv) මුද්දර ගාස්තුව හෝ අඩු ප්‍රමාණය රු. 20 ට වැඩි වන අවස්ථාවක දී නියම කළ යුතු දණ්ඩනය කොමසාරිස්වරයා විසින් නිශ්චය කළ යුතු ය;

(ආ) මුද්දර ගසන ලද කුවිතාන්සියක් දෙන ලෙස ඉල්ලීය හැකිව තුබුණේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා විසින් මුද්දර නොගසන ලද කුවිතාන්සියක් දෙන ලද්දා වූ සහ ඒ කුවිතාන්සියට මුද්දර ගසන ලද නම් එය ඔහුට විරුද්ධ ව සාක්ෂි වශයෙන් පිළිගත හැකි වන්නා වූ අවස්ථාවක දී එය ඉදිරිපත් කරනු ලබන තැනැත්තා විසින් රුපියලක දණ්ඩන මුදලක් ගෙවූ විට ඒ කුවිතාන්සිය එය දුන් තැනැත්තාට විරුද්ධ ව සාක්ෂි වශයෙන් පිළිගත යුතු ය.

(ඇ) ගිවිසුමක් හෝ එකඟවීමක් ලිපි දෙකකින් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත ලිපි හුවමාරුවකින් ඇති කරගනු ලැබූ ද ඉන් එක් ලිපියක යථා පරිදි මුද්දර ගසා ඇත්තා වූ ද අවස්ථාවක දී, ඒ ගිවිසුමට හෝ එකඟවීමට යථා පරිදි මුද්දර ගසා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඇ) යම් නීත්‍යනුකූල ලේඛනයක් ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් ලියා අත්සන් කරනු ලැබ ඇති විට හෝ මේ ආඥාපනතේ 36 වන වගන්තියෙන් හෝ අන් කිසි විධිවිධානයකින් හෝ ඉඩ සලස්වා ඇති පරිදි කොමසාරිස්වර යාගේ සහතිකය යම් නීත්‍යනුකූල ලේඛනයකට ඇත්තා වූ අවස්ථාවක ඒ නීත්‍යනුකූල ලේඛනය යම් අධිකරණයක දී පිළිගැනීමෙහි ලා මෙහි ඇතුළත් කිසි වකින් වැළැක්වීමක් සිදු නොවිය යුතු ය.

(ඉ) කවර නීත්‍යනුකූල ලේඛනයක් වුව ද යම් අපරාධ අධිකරණයක දී පිළිගැනීම මෙහි ඇතුළත් කිසිවකින් වැළැක්වෙන ලෙස නොසැලකිය යුතු ය.".

6. 1971 අංක 50 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් තවදුරටත් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) කොමසාරිස්වරයා විසින්, 38 වන සහ 39 වන වගන්ති යටතේ, සත පහළොවකට නොවැඩි මුද්දර ගාස්තුවක් අය කළ හැකි නීත්‍යනුකූල ලේඛනයක් නොවන යම් නීත්‍යනුකූල ලේඛනයක් තහනම් පිට තබන්නා වූ හෝ 44 (2) වන වගන්තිය යටතේ තමා වෙත එවනු ලැබූ එවැනි නීත්‍යනුකූල ලේඛනයක් භාරගන්නා වූ විටෙක හෝ විනිමය බිල් පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් එසේ තහනම් පිට තබන්නා වූ හෝ භාරගන්නා වූ විටෙක පහත සඳහන් කාර්ය පටිපාටිය ඔහු අනුගමනය කළ යුතු ය:—

(අ) ඒ නීත්‍යනුකූල ලේඛනයට යථා පරිදි මුද්දර ගසා ඇති බව හෝ ඒ වෙනුවෙන් මුද්දර ගාස්තුවක් අය කළ නොහැකි බව හෝ ඔහු අදහස් කරතහොත් අවස්ථාවෝචිත පරිදි එයට යථා පරිදි මුද්දර ගසනු ලැබ ඇති බවට නැත හොත් ඒ වෙනුවෙන් මුද්දර ගාස්තුවක් අය කළ නොහැකි බවට ඒ මත පිටසනක් කිරීමෙන් ඔහු විසින් සහතික කළ යුතු ය.

(ආ) ඒ නීත්‍යනුකූල ලේඛනය වෙනුවෙන් මුද්දර ගාස්තුවක් අය කළ හැකි බවත් එහෙත් එයට යථා පරිදි මුද්දර ගසා නොමැති බවත් ඔහු අදහස් කරතහොත් නියම මුද්දර ගාස්තුව හෝ එම ගාස්තුව සම්පූර්ණ වීමට අවශ්‍ය

ප්‍රමාණය රුපියල් පහක දණ්ඩනයකුත් සමග, නැතහොත්, ඔහු සුදුසු යයි සිතන්නේ නම්, නියම මුද්දර ගාස්තුවේ ප්‍රමාණය හෝ අඩු ප්‍රමාණය රුපියල් පහකට අඩු වුවත් වැඩි වුවත් ඒ ගාස්තුවේ ප්‍රමාණය හෝ අඩු ප්‍රමාණය මෙන් දස ගුණයක දණ්ඩනයකුත් සමග, ගෙවන මෙන් ඔහු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියම කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. 1958 අංක 16 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අහඹුවක් ආදිය නිසා යථා පරිදි මුද්දර ගැසීම නොකරුණු නිත්‍යානුකූල ලේඛන.

47. සත පනහළොවකට නොවැඩි මුද්දර ගාස්තුවක් අය කළ හැකි නිත්‍යානුකූල ලේඛනයක් නොවන්නාවූ ද මුද්දර ගාස්තුවක් අය කළ හැකි නමුදු යථා පරිදි මුද්දර නොගසන ලද්දා වූ ද යම් නිත්‍යානුකූල ලේඛනයක් හෝ මුද්දර ගාස්තුවක් අය කළ හැකි නමුදු යථා පරිදි මුද්දර නොගසන ලද විනිමය බිල් පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් එය ලියා අත්සන් කරනු ලැබූ දිනයෙහි සිට හෝ ප්‍රථමයෙන් ලියා අත්සන් කරනු ලැබූ දිනයෙහි සිට අවුරුද්දක් ඇතුළත යම් තැනැත්තකු විසින් සිය කැමැත්තෙන් ම කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, සහ ඒ නීත්‍යානුකූල ලේඛනය යථා පරිදි මුද්දර ගසා නොමැති බව ඒ තැනැත්තා විසින් කොමසාරිස්වරයාට දැනුම් දී නියම මුද්දර ගාස්තුව හෝ එය සම්පූර්ණ වීමට අවශ්‍ය ප්‍රමාණය කොමසාරිස්වරයාට ගෙවීමට ඔහු ඉදිරිපත් වුව හොත්, සහ ඒ නිත්‍යානුකූල ලේඛනයට යථා පරිදි මුද්දර ගැසීම සිදු නොවී ඇත්තේ අහඹුවකින්, වැරදීමකින් හෝ හදිසි කරුණකින් බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වුවහොත්, 38 වන 39 වන සහ 46 වන වගන්ති යටතේ ක්‍රියා කරනු වෙනුවට ඒ මුදල් ප්‍රමාණය භාරගෙන මෙහි මීළඟට නියමිත ආකාරයෙන් ඔහු විසින් ක්‍රියා කළ හැකි ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"තමා වෙත ලැබෙන මුද්දර නොගසන ලද බිල් පත්‍රවලට, පොරොන්දු නෝට්ටුවලට සහ චෙක්පත් වලට මුද්දර ගැසීමට ගෙවන්නාට ඇති බලය.

53. සත පනහළොවකට නොවැඩි මුද්දර ගාස්තුවක් අය කළ හැකි යම් විනිමය බිල් පත්‍රයක්, පොරොන්දු නෝට්ටුවක් හෝ චෙක් පතක් මුදල් ගෙවීම සඳහා මුද්දර නොගසා ඉදිරිපත් කරනු ලැබූ විට එය එසේ ඉදිරිපත් කරනු ලැබූ තැනැත්තා විසින් අවශ්‍ය කරන ඇලෙන මුද්දර එහි අලවනු ලැබිය හැකි ය. තව ද, මෙයින් පෙර විධිවිධාන සලස්වනු ලැබූ පරිදි, ඒ මුද්දර අවලංගු කරනු ලැබූ විට ඒ බිල් පත්‍රය,

නෝට්ටුව හෝ චෙක්පත වෙනුවෙන් ගෙවිය යුතු මුදල ඔහු විසින් ගෙවිය හැකි ය. එසේම, මුද්දර ගාස්තුව ගෙවිය යුතුව තිබුණේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා ගෙන් එය අය කර ගැනීම හෝ ඉහත සඳහන් පරිදි ගෙවිය යුතු මුදලින් එය අඩු කර ගැනීම කළ හැකි ය. එවිට ඒ බිල්පත්‍රය, නෝට්ටුව හෝ චෙක්පත මුද්දර ගාස්තුව සම්බන්ධයෙන් වූ තාක් දුරට නිසි ලෙස තිබේ යයි ද වලංගු යයි ද සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද ඒ බිල්පත්‍රය, නෝට්ටුව හෝ චෙක්පත පිළිබඳ ව යම් තැනැත්තකු යටත් වීමට බැඳී සිටිය හැකි යම් දණ්ඩනයකින් හෝ නීති කෘත්‍යයකින්, මෙහි ඇතුළත් කිසිවක් කරණකොට ගෙන ඔහු නිදහස් නොවිය යුතු ය.".

9. 1971 අංක 50 දරන පනතින් අන්තිම වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ "අ" උපලේඛනයේ I වන කොටස පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ "අ" උපලේඛනයේ I වන කොටස සංශෝධනය කිරීම.

(1) එහි 14 වන කරුණ වෙනුවට පහත සඳහන් අලුත් කරුණ ආදේශ කිරීමෙන් :—

"14. (චෙක්පතක්, ඉල්ලූ විට ගෙවිය යුතු සහ ශ්‍රී ලංකාවේ බැංකුවක් විසින් හෝ වෙනුවෙන් ඒ බැංකුවට ම ලියන ලද හෝ ශ්‍රී ලංකාවේ බැංකුවකට යම් තැනැත්තකු විසින් ලියන ලද අණකරයක් සහ ඕඩරයෙහි නම් කර ඇති පාර්ශ්වයට සති පතා, මාස් පතා හෝ අන් යම් ප්‍රකාශිත කාලසීමාවල දී හෝ අන් අයුරකින් මුදල් ප්‍රමාණයක් ගෙවීමට බැංකුවක් වෙත කෙරෙන ඕඩරයක් නොවන) ඉල්ලූ විට හෝ දුටු විට හෝ ඉදිරිපත් කළ විට හෝ දිනයෙන් හෝ දැකීමෙන් පසු තෙදිනක් ඇතුළත දී හෝ ගෙවිය යුතු විනිමය බිල් පත්‍රයකට ... ... 0 15

ඉල්ලූ විට හෝ දුටු විට හෝ ඉදිරිපත් කළ විට හෝ දිනයෙන් හෝ දැකීමෙන් පසු තෙදිනක් ඇතුළත නොවන යම් වේලාවක දී විනිමය බිල් පත්‍රයේ, පොරොන්දු නෝට්ටුවේ හෝ අණකරයේ හෝ ඕඩරයේ නම් කර ඇති පාර්ශ්වයට හෝ භාරකට හෝ විධානය අනුව හෝ යම් මුදලක් ගෙවීම සඳහා වූ විනිමය බිල් පත්‍රයකට, පොරොන්දු නෝට්ටුවකට, අණකරයකට හෝ ඕඩරයකට, එම මුදල—

| | |
|---|---|
| රු. 0 ට වැඩිව රු. 100 ට වැඩි නොවූ විට ... | 0 20 |
| රු. 100 ට වැඩිව රු. 250 ට වැඩි නොවූ විට ... | 0 30 |
| රු. 250 ට වැඩිව රු. 500 ට වැඩි නොවූ විට ... | 0 50 |

රු. 500 ට වැඩිව රු. 1,000 ට වැඩි නොවූ විට ... 1 0
ඊට වැඩි සෑම රු. 1,000 ට හෝ ඉන් කොටසකට ... ... 1 0

චෙක්පතකට, ඉල්ලූ විට ගෙවිය යුතු සහ ශ්‍රී ලංකාවේ බැංකුවක් විසින් හෝ වෙනුවෙන් ඒ බැංකුවට ම ලියන ලද හෝ ශ්‍රී ලංකාවේ බැංකුවකට යම් තැනැත්තකු විසින් ලියන ලද අණකරයකට සහ ඕඩරයෙහි නම් කර ඇති පාර්ශ්වයට සතිපතා, මාසපතා හෝ අන් යම් ප්‍රකාශිත කාලසීමාවල දී හෝ අන් අයුරකින් මුදල් ප්‍රමාණයක් ගෙවීමට බැංකුවක් වෙත කෙරෙන ඕඩරයකට ... ... 0 06

**නිදහස් ලේඛන**

(අ) එක්සත් රාජධානියේ ආණ්ඩුවේ සේවයේ යෙදී සිටින්නා වූ යම් තැනැත්තකු විසින් ඔහුගේ රාජකාරි ඉටු කිරීමෙහි ලා ලියනු ලබන සියලු චෙක්පත් ;

(ආ) ශ්‍රී ලංකාව විෂයෙහි හෝ එක්සත් රාජධානියේ යටත් විජිත හෝ එක්සත් රාජධානියට අයත් විදේශයන් විෂයෙහි අණකර ලිවීමට ශ්‍රී ලංකාවේ තැනැත්තන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තන්ට බලය පවරමින් යවනු ලබන කච්චල වශයෙන් වූ හෝ නොවූ සියලු ණයවර ලිපි." ;

(2) එහි 16 වන කරුණෙහි " ඉහත සඳහන් සහ වෙනත් සියලුම මුද්දර ගාස්තුවලින් නිදහස් වන ලේඛන " යන ශීර්ෂය යටතේ එන (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

" (උ) (89 වන අධිකාරය වූ) උකස් පනතේ 3 වන වගන්තියෙහි නිරූපිත පිළිගත් ණය නියෝජිත ආයතනයක් නමට ඇති ද්‍රව්‍යමය චංචල දේපළ පිළිබඳ භාරකර ලිපියක්, භාර කුවිතාන්සියක් හෝ භාරකර ප්‍රකාශයක්." ;

(3) එහි 23 වන කරුණෙහි (1) ඡේදයේ (ආ) අනුඡේදය අස් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් අනුඡේදය ආදේශ කිරීමෙන් :—

" (ආ) යම් ප්‍රතිඥාවක් සඳහා යම් නිශ්චල දේපළක් හිමිකර ලියාදීමට හෝ පවරා දීමට —

එම හිමිකරයෙහි හෝ පැවරුම්කරයෙහි ප්‍රකාශිත ව සඳහන් ගැනුම් මිල හෝ ප්‍රතිඥා මුදල, නැතහොත් ප්‍රතිඥාව මුදලක් නො වන්නා

වූ විට හෝ කොටසක් මුදලකින් ද කොට සක් මුදලක් නොවූවකින් ද සමන්විත වන විට, එම දේපළෙහි වටිනාකම—

| | |
|---|---|
| රු. 0 ට වැඩි ව රු. 50 ට වැඩි නොවූ විට ... | 1 0 |
| රු. 50 ට වැඩි ව රු. 100 ට වැඩි නොවූ විට ... | 2 0 |
| රු. 100 ට වැඩි ව රු. 200 ට වැඩි නොවූ විට ... | 4 0 |
| රු. 200 ට වැඩි ව රු. 300 ට වැඩි නොවූ විට ... | 6 0 |
| රු. 300 ට වැඩි ව රු. 400 ට වැඩි නොවූ විට ... | 8 0 |
| රු. 400 ට වැඩි ව රු. 500 ට වැඩි නොවූ විට ... | 10 0 |
| රු. 500 ට වැඩි ව රු. 1,000 ට වැඩි නොවූ විට ... | 15 0 |
| රු. 1,000 ට වැඩි ව රු. 15,000 ට වැඩි නොවූ විට— | |
| එහි සෑම රු. 500 කට හෝ ඉන් කොටසකට ... | 8 0 |
| රු. 15,000 ට වැඩි ව රු. 50,000 ට වැඩි නොවූ විට— | |
| එහි සෑම රු. 100 කට හෝ ඉන් කොටසකට ... | 3 0 |
| රු. 50,000 ට වැඩි ව රු. 75,000 ට වැඩි නොවූ විට— | |
| එහි සෑම රු. 100 කට හෝ ඉන් කොටසකට ... | 4 0 |
| රු. 75,000 ට වැඩි ව රු. 100,000 ට වැඩි නොවූ විට— | |
| එහි සෑම රු. 100 කට හෝ ඉන් කොටසකට ... | 5 0 |
| රු. 100,000 ට වැඩි වූ විට එහි සෑම රු. 100 කට හෝ ඉන් කොටසකට ... | 6 0: |

එසේ වුව ද, යම් නිශ්චල දේපළක් හිමි කර ලියාදීමෙහි හෝ පවරාදීමෙහි කොටසක් හිමිකරයක් හෝ පැවරුම්කරයක් ද කොට සක් ත්‍යාගයක් ද ලෙස මුද්දර කොමසා රිස් විසින් සලකනු ලබන අවස්ථාවක, ඒ දේපළෙහි වටිනාකම රුපියල් 15,000 ඉක්ම

වන්නේ නම්, ඒ හිමිකරය හෝ පැවරුම් කරය පිළිබඳ නීත්‍යනුකූල ලේඛනයෙහි දක්වා ඇති ප්‍රතිෂ්ඨාව රුපියල් 15,000 කට අඩු වූයේ වී නමුදු එය නොතකා, ඒ ගනු දෙනුවේ හිමිකරයක් හෝ පැවරුම්කරයක් ලෙස සලකනු ලබන කොටස වෙනුවෙන් අය කළ යුතු මුද්දර ගාස්තුව ඉහත දක්වා ඇති උචිත ප්‍රමාණය අනුව විය යුතු ය.”; සහ

(4) එහි 49 වන කරුණ වෙනුවට පහත සඳහන් අලුත් කරුණ ආදේශ කිරීමෙන් :—

“49. රු. 20 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක යම් මුද ලක් හෝ වෙනත් දේපළක් හෝ සඳහා දෙනු ලබන කුවිතාන්සියකට හෝ නිදහස් කිරීම් පත්‍රයකට ... ... 0 15

නිදහස් ලේඛන

(අ) හවුලේ අයිති ඉඩමක් පිළිබඳ බෙදුම් ඔප්පුව;

(ආ) යම් බැංකුකරුවකු වෙත තැන්පත් කරනු ලබන ගණන් දිය යුතු වූ මුදලක් සඳහා හෝ එවැනි මුදලක් වෙනුවෙන් තැන්පත් කරනු ලබන සුරැකුම් පත් සඳහා දෙනු ලබන කුවිතාන්සි :

එසේ වුව ද ගණන් දිය යුත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා නො වන තැනැත්තකුගෙන් හෝ තැනැත්තකු වෙතින් ඒ මුදල හෝ සුරැකුම් පත් භාර ගත් ලෙස එහි සඳහන් කරනු නොලැබිය යුතු ය :

එසේම තවදුරටත්, යම් සංස්ථාපිත සමා ගමක හෝ වෙනත් සංස්ථාපිත මණ්ඩල යක හෝ පිහිටුවීමට යෝජිත හෝ අදහස් කර ඇති එවැනි යම් සමාගමක හෝ මණ්ඩ ලයක යම් කොටසක් විභාජනය කිරීමේ ලිපියක් සඳහා හෝ වෙනුවෙන් ගෙවන ලද හෝ තැන්පත් කරන ලද යම් මුදලක් සඳහා වූ, හෝ එකී යම් සමාගමක හෝ මණ්ඩලයක යම් කොටස් සහතිකයක් හෝ කොටසක් වෙනුවෙන් මුදල් ගෙවීමට කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ, හෝ විකිණිය හැකි ඇපයක් වූ ණය පත්‍රයක් සම්බන්ධයෙන් වූ හෝ කුවිතාන්සියක් නැතහොත් ලද බව දැන්වීමක් කෙරෙහි මෙම නිදහස් කිරීම අදාළ නොවිය යුතු ය.

(ඈ) යථා පරිදි මුද්දර ගසන ලද හෝ මේ ආඥා පනතේ 2 (1) වන වගන්තියේ අතුරු විධානය යටතේ නිදහස් කරන ලද (ආණ්ඩුව වෙනුවෙන් ලියා අත්සන් කරන ලද නීත්‍යානුකූල ලේඛන) යම් නීත්‍යානුකූල ලේඛනයක් මත පිටසන් කරන ලද්දා වූ හෝ එකී නීත්‍යානුකූල ලේඛනයක අඩංගු වූ ද එහි ප්‍රකාශිත ව සඳහන් ප්‍රතිෂ්ඨා මුදල ලද බව දන්වන්නා වූ ද කුවිතාන්සියක්, හෝ නීත්‍යානුකූල ලේඛනයෙන් ආරක්ෂිත යම් මුල් මුදලක්, පොලියක් හෝ වාර්ෂික යක් හෝ වෙනත් වාර පතා ගෙවීමක් පිළි බඳ කුවිතාන්සියක් ;

(ඇ) යම් තීරු බද්දක් ගෙවීම පිළිබඳ ව දෙන කුවිතාන්සි ;

(ඉ) වටිනාකම අඩුවෙන් තක්සේරු කිරීම නිසා රජය විසින් ගන්නා ලද බඩුවල වටිනාකමට දෙන කුවිතාන්සි ;

(ඊ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත යම් නිලධරයකු විසින් ස්වකීය ධුරයේ කටයුතු කිරීමේ දී දෙන කුවිතාන්සි හෝ නිදහස් කිරීම් පත්‍ර :

එසේ වුව ද, යම් රාජ්‍ය නිලධරයකුගේ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් එම රාජ්‍ය නිලධරයා විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ට හෝ වෙනත් බලධරයකුට දෙන කුවිතාන්සි මේ නිදහස් කිරීමට ඇතුළත් නොවිය යුතු ය.

(උ) තත් කාලයේ ශ්‍රී ලංකාවේ නතර කර සිටින එක්සත් රාජධානියේ හමුදාවල නිලධරයන් සහ සොල්දාදුවන් විසින් වැටුප් හෝ දීමනා සඳහා දෙනු ලබන කුවිතාන්සි හෝ නිදහස් කිරීම් පත්‍ර ;

(ඌ) එක්සත් රාජධානියේ ආණ්ඩුවේ සේවයේ නියුක්තව සිටින යම් නිලධරයකු විසින් සවකීය ධුරයේ කටයුතු කිරීමේ දී දෙනු ලබන කුවිතාන්සි හෝ නිදහස් කිරීම් පත්‍ර ;

(එ) මහජනාධාර, ආපදා සහන හෝ විරක්ෂා සහන සඳහා ශ්‍රී ලංකාවේ ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරන ලද මුදල් වලින් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් විසින් ගෙවනු ලබන දීමනා සඳහා වූ කුවිතාන්සි ; ".

9(1) වන වගන්තියෙන් කරන ලද සංශෝධනය අතීතයටත් බලපෑම.

**10.** 9 වන වගන්තියේ (1) වන ඡේදයෙන් ප්‍රධාන ප්‍රඥප්ති යෙහි කරන ලද සංශෝධනය 1971 නොවැම්බර් 15 වන දින සිට වලංගු වූ ලෙස සලකනු ලැබිය යුතු ය.